# අනිල්ගේ උපන්දිනය




දුලෝදයා ඔසඳි කරුණාරත්න

# අනිල්ගේ උපන්දිනය

## දුලෝද්යා ඔසඳි කරුණාරත්න

කතෘ

## කතෘගේ වෙනත් කෘති

**ඕලු මුව පැටියාගේ උපාය**
**කොත්තු ළමයා**
**Amy the magic Lilliput**

**පාසල** : මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර

**ඉගෙනුම ලබන පන්තිය** : 5 ශ්‍රේණිය E

**කෘතිය පළ කරන දිනය** : 2025.02.08

**ISBN 978-624-208-766-5**

**IS38361**

**කතාව, පිටකවරය සහ චිත්‍ර :**

දුලෝද්යා ඔසඳි කරුණාරත්න
**35A/1,**
වැවතැන්න පාර,
අම්පිටිය

# පිදුම

**දැයේ නං ගිලා මල්ලිලාට මම ලියූ මේ කතන්දර පොත**

**ඉතාම ගෞරවයෙන් පුද කරමි.**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණිය යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝදමත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන හෙරණ ගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලාතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමයා බාලිකා විද්‍යාලය  මහනුවර

# අනිල්ගේ උපන්දිනය

අපි වගේ ගොඩක් ළමයි මේ රටේ ලෝකේ ඉන්නවනේ. ඉතින් අද මම කතාවක් ගෙනාවේ අනිල් කියලා ළමයෙක් ගැන. අනිල් හිටියේ නේවාසිකාගාරයේ. මොකද දන්නවාද, එයාගේ දෙමව්පියෝ අවුරුදු දෙකක පමණ කාලයකට රැකියාවක් සඳහා විදේශගත වුණ නිසා.



අනිල්ගේ හොඳම යාලුවා වුණේ වත්සල. වත්සල හිටියේ අනිල් ඉගෙනුම ලබන පාසලේමයි. ඒ වගේම අනිල් ඉන්න නේවාසිකාගාරයේමයි. දෙන්නා හිටියේ එකම පන්තියේ මයි.



දවසක් වත්සල දැක්කා අනිල් දුකින් ඉන්න බව. වත්සල අනිල් ගෙන් ඇයි ඔයා දුකින් ඉන්නේ? කියලා ඇහුවා.



එතකොට අනිල් කිව්වා, ඔයා දන්නවනේ ඊළඟ සතියේ මගේ උපන්දිනය. මම මේ සමරන්නේ මගේ දොළොස් වෙනි උපන්දිනය. ඉතින් මං කොහොමද මගේ උපන් දිනය මගේ අම්මයි තාත්තයි නැතුව සමරන්නේ? කියලා හරිම දුකින් කිව්වා.



ඒ කතාව අහපු වත්සලට හරිම දුකයි. එයා එයාගේ කාමරේට ගිහිල්ලා හොඳට කල්පනා කළා. පහුවදාම එයා නේවාසිකාගාරයේ පරිපාලනතුමිය හමුවී, මේ ප්‍රශ්නය ගැන කිව්වා. ඒ වගේම වත්සල හිතපු දේ ගැනත් කිව්වා.



ටික දවසක් ගෙවිලා ගියා. අනිල්ගේ උපන්දින දවස ආවා. සුපුරුදු පරිදි අනිල් නුත්, වත්සලත් නේවාසිකාගාරයට ආවා. කාටත් නොදැනෙන්න, අනිල්ව සමන් එක්ක සෙල්ලම් කිරීමට පිට්ටනියට යැව්වා.



නේවාසිකාගාරයේ පරිපාලනතුමියත්, යාලුවොත්, එකතු වෙලා අනිල් ඉන්න කාමරය සැරසිලි කළා. අනිල්ගේ දෙමව්පියන් විසින් විසිතුරු කෑම ජාති නේවාසිකාගරය වෙත එවා තිබුනා.



මේ අතරේ අනිල් සහ සමන් සෙල්ලම් කරලා ඉවරවෙලා නේවාසිකාගාරයට ආයෙත් ආවා. අනිල් එයාගේ කාමරේට ගියා. එයා දැකපු දෙයින් පුදුම වුණා. අනිල්ගේ දෙමව්පියෝ ඩිජිටල් තාක්ෂණය ඔස්සේ ඒ මොහොතේ සම්බන්ධ වෙලා හිටියා. එයාට හරිම සතුටුයි.



නේවාසිකාගාරයේ පරිපාලනතුමිය ඇතුලු අනිල්ගේ යාලුවෝ ඔක්කොම එකතු වෙලා, කේක් කපලා, අනිල්ට සුභ උපන්දිනයක් වේවා කියලා සුභ පැතුවා. අනිල්ගේ අම්මයි තාත්තයි හුඟක් ආදරෙන් ඇස් දෙකේ කඳුළු පුරෝගෙන මේ වෙන හැම දෙයක් දිහාම බලාගෙන හිටියා.



“මේ ඔක්කොම වත්සලගේ වැඩ, මේ වගේ යාළුවෝ තමයි අපිට ඉන්න ඕනි” කියලා නේවාසිකාගාරයේ පරිපාලන තුමිය කිව්වා.



ඔයා නම් හරිම හොඳ යාළුවෙක් අනිල් කේක් කෑල්ලක් වත්සලට කවන ගමන් කිව්වා.



නිමි.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑතඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

**ISBN 978-624-208-766-5**
**IS38361**